**මාසික විශේෂාංගය**

## චන්ද්‍රිකා තාක්ෂණයට හැඳින්වීමක්

# සංස්කෘතිය වෙනස් කළ ඉලෙක්ට්‍රොනික ඇස

ඔවුන් ඈත අහසේ සිට අප දෙස බලා සිටින්නේ ය. ඒ ඉලෙක්ට්‍රොනික ඇස් වලිනි. මේ ඉලෙක්ට්‍රොනික ඇස් නිර්මාණය කළේ ද පොළොවේ සිටින අපේ කාලයේ මිනිසුන් ය. කෘත්‍රිම චන්ද්‍රිකා වශයෙන් අප දන්නේ මේ ඉලෙක්ට්‍රොනික ඇස් ගැන ය.

ආලෝකයේ වේගයෙන් දුරකතන පණිවිඩ හුවමාරු වන්නේ මේ චන්ද්‍රිකා හරහා ය. තත්පර ගණනකින් මුළු ලෝකයම එක හුයකින් වෙළීමට හේතු වී තිබෙන්නේ මේ චන්ද්‍රිකා ය. ලෝකය ම එක ගම්මානයක් වී තිබෙන්නේ මේ චන්ද්‍රිකාවල ක්‍රියාත්මක වීම මත ය. ඒ හැරුණුවිට තවත් කළ හැකි දේ බොහෝ ය. නූතන ලෝකයේ බලවත් ම තාක්ෂණික උපකරණය බවට චන්ද්‍රිකා පත්වී ඇත්තේ මේ නිසා ය.

ඇත්ත වශයෙන් ම පොළොව වටා කරකැවෙන මේ ජිමික් උපාංග කීයක් තිබෙනවා ද?

උත්තරදීමට හොඳ කෙනෙක් ඉදිරිපත් වී සිටින්නේ ය. ඔහු ලූතිනන් කර්නල් ටෙරි ඕ'රෝක් ය. ඔහු උතුරු ඇමරිකානු ගගනවිද්‍යා ආරක්ෂක කටයුතු හැසිරවීමේ ආයතනයේ (NORAD - North American Aerospace Defence Command) ප්‍රකාශකයෙකි. කොලරාඩෝ නුවර ෂෙයෙන්නේ කඳුවැටියේ සිට ඔහු කථා කරයි.

"දැන් දන්නා විදියට නම් 5000 කට වැඩියි.

එක චන්ද්‍රයෙක් කරකැවෙන ලෝකයක උපන් මිනිසුන් දැන් කෘත්‍රිම චන්ද්‍රිකා 5000 ක් කරකැවෙන ලෝකයක ජීවත් වෙමින් සිටියි.

මේ දැනට ක්‍රියාත්මක චන්ද්‍රිකා ගැන ය. එහෙත් පොළොවේ මිනිසුන් අහසට යැවූ චන්ද්‍රිකා ගණන මීට වැඩි ය. "මම නොරාඩ් (NOARD) ආයතනයේ වාර්තා බැලුවා. මේ වනවිට මිනිසුන් ඉහළ අහසේ රඳවන්න මහන්සි වුණු චන්ද්‍රිකා ගණන 14000 ක්" ලූතිනන් කර්නල් ටෙරී ඕ'රොක් කියන්නේ එසේ ය.

පොළොව ගැන බලා සිටීමට






## විවිධ ජාතීන් විසින් ගුවන්ගත කොට ඇති චන්ද්‍රිකා

වැඩිම චන්ද්‍රිකා ගණනක් කක්ෂගත කොට තිබෙන්නේ රුසියාව යි. එහෙත් රුසියානු චන්ද්‍රිකා කල් පවතින ඒවා නොවේ. මෙහි එක් තිතකින් චන්ද්‍රිකාවක් නියෝජනය වේ. දීප්තිමත් තිත්වලින් පෙන්වන්නේ දැනටත් ක්‍රියාත්මක චන්ද්‍රිකාවන් ය.

පොලොවෙන් ඉහළට චන්ද්‍රිකා යැවූ ජාතීන් අතර ඇමරිකාව හා සෝවියට් දේශය ප්‍රකට ය. ඇමරිකාව දැන් චන්ද්‍රිකා 290 ක් ක්‍රියාත්මක කරන බව කියන්නේ ඇමරිකාවේ ජාතික ගගනවිද්‍යා හා අභ්‍යවකාශ පරිපාලනාධිකාරිය (NASA - National Aeronautics and Space Administration) විසිනි. එහෙත් ඇමරිකානුවන් අහසට යැවූ චන්ද්‍රිකා ගණන 1000 කට වැඩි ය.

සෝවියට් දේශය ගුවන්ගත කොට තිබෙන චන්ද්‍රිකා ගණන 2069 කි.

එහෙත් සෝවියට් දේශය බිඳ වැටෙන කාලයේදී ඉන් ක්‍රියාත්මකව තිබුණේ 102 ක් පමණි. සෝවියට් වර්ගයේ චන්ද්‍රිකා වැඩිකල් පවතින ඒවා නොවේ. ඇමරිකානු චන්ද්‍රිකාවල ආයුෂ වැඩි ය. ඒ නිසා ම දැන් අහසේ සිටින කෘත්‍රිම චන්ද්‍රිකාවලින් වැඩි බලය ඇත්තේ ඇමරිකාවට ය. චන්ද්‍රිකා තාක්ෂණය භාවිතයට ගන්නා ජාතීන් වන්නේ ඇමරිකාව හා සෝවියට් දේශය පමණක් නොවේ. ජපානය, කැනඩාව, ඉන්දුනීසියාව, ඉන්දියාව, චීනය හා ඕස්ට්‍රේලියාව එවන් තවත් ජාතීන් ය. එමෙන් ම යුරෝපීය ජාතීන් 13 ක් ද චන්ද්‍රිකා ගුවන් ගතකොට ඉන් ප්‍රයෝජන ලබා ගනිමින් සිටින්නේ ය.